චීන ජාතිකයෙකු හැඳින්වීම සඳහා "චීනා" වැනි යෙදුම් බොහෝ විට කටවහරෙහි භාවිතා වේ. මේවා සෘණාත්මක සන්දර්භයන් තුළ මෙන්ම එසේ නොවන තැන් වලදීද භාවිතා වේ. නමුත් මෙවැනි යෙදුමක් පොදුවේ නිෂේධනාත්මක නොවේදැයි අප ඇසිය යුතුවේ. මන්දයත්, "චීනා" වැනි යෙදුමක් ඔස්සේ යම් අවමානාත්මක, කොන් කිරීමේ ස්වරයක් ජනිත වන බැවිනි. මාධ්‍ය ඔස්සේ "චීනා" වැනි යෙදුම් නිරන්තරයෙන් භාවිතා වීම, විදේශික භීතිකාවක් (xenophobia) ඇතිවීමට පවා රුකුලක් නොවනු ඇතිදැයි එසේම අප ඇසිය යුත්වේ.

එසේම මෙහිදී අවබෝධ කරගත යුත්තේ, අන්තර්ගතය තුළ වඩාත් යෝග්‍ය ලෙසට "චීන ජාතිකයා" යනුවෙන් සඳහන් වන බවයි. එසේ නම්, "චීනා" වැනි යෙදුම් සිරස්තල තුළ යොදාගැනෙන්නේ මන්ද? එය කෙතරම් ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක්ද?

මෙහිදී සිරස්තල යොදන්නේ පුවත ලියූ මාධ්‍යවේදියා නොවීමට ඇති ඉඩද සැලකිල්ලට ගත යුතුවේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa